සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

29384

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |


නම : ..................................................................... විභාග අංකය : ..........................................

## I කොටස

සැලකිය යුතුයි :

- 01 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමි වේ.

(1) පහත දැක්වෙන රූප අතුරින් ද්විපාර්ශ්වික සමමිති අක්ෂය නිවැරදි ව ඇඳ ඇති රූපය තෝරා එහි අක්ෂරය ලියන්න.




(2) A = { 0 ත් 15 ත් අතර 3 හි ගුණාකාර } වේ. A කුලකය වෙන් රූප සටහනක දක්වන්න.


(3) සුළු කරන්න. $6 + 15 \div 3$

(4) $2\ g\ 325\ mg$ ග්‍රෑම් වලින් දක්වන්න.

(5) රූපයේ දී ඇති තොරතුරු වලට අනුව,


(i) QRS කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද?

(ii) PQS කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද?



(6) 1 6 2 □ යන ස්ථාන 4කින් යුත් සංඛ්‍යාව 3 න් හා 9 න් ඉතිරි නැතිව බෙදේ. හිස් කොටුවට ගැළපෙන ඉලක්කම ලියන්න.

(7) දී ඇති සෘජුකෝණාස්‍රයේ පරිමිතිය 28 cm වේ.
$x$ හි අගය සොයන්න.




(8) දිනේෂිගේ උපන් දිනය 2003 - 07 - 15 වේ. ඇගේ නැගණියත් ඇයත් අතර අවුරුදු 4 මාස 5 දින 20ක වයස් පරතරයක් ඇත. නැගණියගේ උපන් දිනය කවදාද?

(9) අගය සොයන්න. $(-9) + (+7)$

(10) ඇපල් ගෙඩියක මිල රු. $a$ මගින් ද දොඩම් ගෙඩියක මිල රු. $b$ මගින් ද දැක්වේ. ඇපල් ගෙඩි 3 ක් හා දොඩම් ගෙඩි 2 ක මිල දැක්වීමට $a$ හා $b$ අඩංගු ප්‍රකාශනයක් ලියන්න.


(11) එක්තරා ඝණ වස්තුවක ශීර්ෂ 5 ක් හා මුහුණත් 6 ක් තිබිණි. ඔයිලර් සම්බන්ධය භාවිත කරමින් එහි දාර ගණන සොයන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

(12) රූපයේ දැක්වෙන වෘත්තයේ කේන්ද්‍රය O වේ.

(i) එහි විෂ්කම්භය නම් කරන්න.

(ii) විෂ්කම්භයේ දිග 12 cm නම් අරය කොපමණ වේ ද?





(13) විෂම භාගයක් ලෙස දක්වන්න.

$$3\frac{2}{7}$$

(14) ඝනකාභ හැඩති ඇසුරුමක දිග පළල උස පිළිවෙලින් 12 cm, 8cm, 5cm වේ. එහි පරිමාව කොපමණ ද?

(15) රසකැවිලි වර්ගයක් නිෂ්පාදනයේ දී සීනි පිටි හා බටර් මිශ්‍ර කරනු ලබන්නේ පිළිවෙලින් 400 $g$, 500$g$ හා 250$g$ ලෙස ය. මිශ්‍රණයේ අඩංගු සීනි පිටි හා බටර් අතර අනුපාතය සොයා එම අනුපාතය සරලම ආකාරයෙන් දක්වන්න.

(16) කාටීසීය තලය මත ලකුණු කර ඇති A හා B ලක්ෂ්‍යවල ඛණ්ඩාංක ලියන්න.





(17) පානීය ජල බෝතලයක අඩංගු ජල ප්‍රමාණය 1 $l$ 250 $ml$ ලෙස සඳහන් කර ඇත. එවැනි බෝතල් 6 ක අඩංගු ජල ප්‍රමාණය කොපමණ ද?

(18) තොග වෙළෙන්දෙක් බිත්තර 100 ක් මිලදී ගන්නා ලදී. ප්‍රවාහනයේ දී ඉන් 8 ක් බිඳුනි. නොබිඳුනු බිත්තර ගණන මිල දී ගත් බිත්තර සංඛ්‍යාවේ,

(i) භාගයක් ලෙස දක්වන්න.

(ii) ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

(19) පහත දැක්වෙන රූප අතරින් ශුද්ධ ටෙසලාකරණයක් සඳහා යොදාගත හැකි තල රූපය තෝරා යටින් ඉරක් අඳින්න.



(i) (ii) (iii) (iv)


(20) සමබර කාසියක් එක් වාරයක් උඩ දමා උඩට හැරී වැටෙන පැත්ත නිරීක්ෂණය කිරීමේදී ලැබිය හැකි සියළු ප්‍රතිඵල මොනවා ද?

To download past papers visit
www.vajirapani.blogspot.com

## II කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙක් ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමි වේ.

(1) පහත දක්වා ඇත්තේ එක්තරා පාසලක 7 ශ්‍රේණියේ සිසුන් කණ්ඩායමක් විසින් පරිමාණ රූප පාඩම ආශ්‍රිත ක්‍රියාකාරකමක දී සකස් කරන ලද නිවස සහිත ඉඩමක සැලැස්මකි. මෙහි පරිමාණය 1 : 200 වේ.




(a) (i) $D_1$ දොරෙහි සැබෑ දිග සොයන්න.

(ii) විසිත්ත කාමරයේ සැබෑ පරිමිතිය සොයන්න.

(iii) මුළුතැන්ගෙයි සැබෑ වර්ගඵලය සොයන්න.

(b) පහත දී ඇති අංග, දී ඇති සැලසුමට ඔබ විසින් අලුතෙන් එක් කළ යුතුව ඇත. නියමිත පරිමාණයට අනුව සුදුසු ස්ථාන වල එම අංග දී ඇති සැලසුමෙහි අඳින්න. (මිනුම් නිවැරදි ලෙස ලකුණු කළ යුතුයි.)

(i) වර්ග මීටර 8 කින් යුත් සෘජුකෝණාස්‍රාකාර හැඩැති ගරාජය නිවසට යාබදව,

(ii) දිග 5 m ද පළල 3 m ද වූ සෘජුකෝණාස්‍රාකාර නාන තටාකය.

(2) (a) (i) 243 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියන්න.

(ii) එය බල ආකාරයෙන් ලියන්න.


(iii) $2\times2\times2\times2\times x\times x\times y$ දර්ශක අංකනයෙන් ලියා දක්වන්න.

(b) $a = 3$ , $b = 2$ වන විට පහත සඳහන් එක් එක් ප්‍රකාශනයේ අගය සොයන්න.

(i) $a^2b^3$

(ii) $4ab^2$

(3) (a) දී ඇති වගුව උත්තර පත්‍රයට පිටපත් කරගෙන පහත රූප සටහන ඇසුරින් එහි හිස්තැන් පුරවන්න.



29387

| කෝණය | කෝණයේ විශාලත්වය | කෝණයේ බාහු | කෝණ වර්ගය |
|---|---|---|---|
| $A\hat{B}C$ | .............................. | .............................. | .............................. |
| $B\hat{C}D$ | .............................. | .............................. | සුළු කෝණ |
| ......................... | $270^0$ | CD, DE | .............................. |
| $D\hat{E}F$ | $90^0$ | .............................. | .............................. |


(b) ස්ථිති කෝණයකට හා ගතික කෝණයකට උදාහරණය බැගින් ලියන්න.

(4) *(a)* ඇපල් ගෙඩියක මිල රු. $x$ වේ. දොඩම් ගෙඩියක මිල රු. 25 ක් වේ. ඇපල් ගෙඩි 3 ක් හා දොඩම් ගෙඩි 2 ක් මිලදී ගැනීමට රු. 140 ක් වැය වේ නම්,

(i) ඉහත තොරතුරු ඇසුරෙන් සමීකරණයක් ගොඩ නගන්න.

(ii) ඉහත සමීකරණය විසඳීමෙන් ඇපල් ගෙඩියක මිල සොයන්න.

(b) ABCD සෘජුකෝණාස්‍රය වර්ගඵලයෙන් සමාන කුඩා සෘජුකෝණාස්‍ර 5 කට වෙන් කර ඇති ආකාරය රූපයේ දක්වේ. කුඩා සෘජුකෝණාස්‍රයක වර්ගඵලය $3a$ වේ.




(i) ABCD සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය A නම්, A හා $a$ අතර සම්බන්ධය දැක්වීම සඳහා සූත්‍රයක් ගොඩනගන්න.

(ii) ඉහත ABCD සෘජුකෝණාස්‍රයේ වර්ගඵලයට වඩා වර්ග ඒකක 4 ක් අඩු වූ වෙනත් සෘජුකෝණාස්‍රයක වර්ගඵලය B නම්, B හා $a$ අතර සම්බන්ධය දැක්වීමට සූත්‍රයක් ගොඩනගන්න.

(iii) a = 2 විට, A හා B අගයයන් වෙන වෙනම සොයන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

(5) (a) (i) $1\frac{2}{5}$ දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

(ii) 2.3 භාග සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

(b) අගය සොයන්න.

(i) $2.043 \times 4$

(ii) $7.2438 \times 1000$

(iii) $1.36 \div 10$

(iv) $25.824 \div 8$

(6) කවකටුව හා cm / mm මිනුම් සහිත සරල දාරය භාවිතයෙන් පහත සඳහන් නිර්මාණ එකම රූපයක දක්වන්න.

(i) අරය 5cm වූ වෘත්තයක් නිර්මාණය කරන්න.


(ii) ශීර්ෂ එම වෘත්තය මත පිහිටන සේ පාදයක දිග 5 cm ක් වූ සවිධි ෂඩාස්‍රයක් නිර්මාණය කරන්න.

(iii) ෂඩාස්‍රය PQRSTU ලෙස නම් කරන්න.

(iv) පාදයක් PQ වූ ද O ලක්ෂ්‍යය වෘත්තය තුළ පිහිටියා වූද OPQ සමපාද ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

(v) $P\hat{O}Q$ හි විශාලත්වය මැන ලියන්න.

(7) එක්තරා අයිස්ක්‍රීම් කර්මාන්ත ශාලාවක වැනිලා, ස්ට්‍රෝබෙරි, චොකලට් යන රසයෙන් යුත් අයිස්ක්‍රීම් නිෂ්පාදනය කරයි. එක්තරා වසරක මුල් මාස 3 තුල දී වෙළෙඳ පොළට නිකුත් කළ අයිස් ක්‍රීම් ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත තීර ප්‍රස්තාරයේ දැක්වේ.




(i) අඛණ්ඩව ඉල්ලුම වැඩි වී ඇත්තේ කුමන රසයෙන් යුත් අයිස්ක්‍රීම් වර්ගයේ ද?

(ii) ජනවාරි මාසය තුළ නිපද වූ චොකලට් රසයෙන් යුත් අයිස්ක්‍රීම් ප්‍රමාණය කොපමණ ද?

(iii) පෙබරවාරි මාසය තුළ නිපද වූ මුළු අයිස්ක්‍රීම් ප්‍රමාණය ලීටර් කීය ද?

(iv) මාර්තු මාසයේ නිපද වූ චොකලට් රසයෙන් යුත් අයිස්ක්‍රීම් ප්‍රමාණය හා පෙබරවාරි මාසයේ නිපද වූ ස්ට්‍රෝබෙරි රසයෙන් යුත් අයිස් ක්‍රීම් ප්‍රමාණය අතර වෙනස කොපමණ ද?

(v) මාස 3 ක කාලය තුළ කර්මාන්ත ශාලාවේ නිපද වූ වැනිලා රස අයිස්ක්‍රීම්, ලීටරයක මිල රු. 80 බැගින් විකුණන ලද්දේ නම් ඉන් ලැබූ ආදායම කොපමණ ද?